රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 201

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7,
1985.05.21

සියලුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

# 1985 අංක 19 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සංශෝධන පනත – රජයේ නිලධාරිනියන්ගේ මනාපය පළකිරීම

1. 1983.11.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 231 බලන්න.

2. රජයේ නිලධාරිනියකගේ ඇවෑමෙන් ඇයගේ වැන්දඹු පුරුෂයාට හා අනත්දරුවන්ට විශ්‍රාම වැටුපක් ලබා ගැනීමට හැකිවන පරිදි රාජ්‍ය සේවයේ නියුතු නිලධාරිනියන්ට මෙම විශ්‍රාම වැටුප් ක්‍රමයට බැඳීම පිණිස අලුතින් මනාපය පළ කිරීමට හැකිවන පරිදි කාලය දීර්ඝ කිරීමට ඉඩ සළසා, 1983 අංක 24 දරන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ 3 වන වගන්තිය 1985 අංක 19 දරන පනතින් සංශෝධනය කර ඇත.

3. දැන් තත්ත්වය මෙසේය :—

3 : 1 දායිකාවකවීම සඳහා සුදුසුකම :

(අ) 1983 අගෝස්තු මස 1 වන දිනට ප්‍රථම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකට පත් කරනු ලැබ, එදින සේවයේ නියුතුව සිටි, එහෙත් 1984.02.01 දින වන විට යථෝක්ත විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකවීමට මනාපය පළ නොකළ රජයේ නිලධාරිනියකට දැන් එසේ දායකවීම සඳහා 1986 මැයි 10 දිනට පෙර සිය මනාපය පළ කළ හැකිය.

(ආ) කලින් නිකුත් කළ චක්‍රලේඛය අනුව සිය මනාපය පළ නොකළ රජයේ නිලධාරිනියකට දැන් අළුතින් මෙම මනාපය පළ කළ හැකිය.

(ඇ) එසේම, කලින් නිකුත් කළ චක්‍රලේඛය යටතේ දායිකාවක නොවීමට සිය මනාපය පළ කළ රජයේ නිලධාරිනියකටද, දායිකාවකවීම සඳහා දැන් මනාපය පළ කළ හැකිය.

(ඈ) එවැනි නිලධාරිනියක් ස්වාමිපුරුෂයා හා/හෝ දරුවා/දරුවන් ජීවත්ව සිටියදී මිය ගොස් ඇතොත් හෝ 1986 මැයි 10 දිනට පෙර මියයතොත් ඇය දායිකාවකවීම සඳහා මනාපය පළකළ අයෙකු වශයෙන් සළකනු ලැබේ.

3 : 2 දායකත්වයෙන් ඉවත්වීමට අවශ්‍ය සුදුසුකම් :

(අ) කලින් නිකුත් කළ චක්‍රලේඛය යටතේ මෙම ක්‍රමයට දායකවීමට මනාපය පළකර ඇති රජයේ නිලධාරිනියකට සිය මනාපය පරිදි 1986 මැයි 10 දිනට පෙර ඉන් ඉවත්විය හැකිය.

(ආ) කලින් මෙම ක්‍රමයට බැඳීමට මනාපය පළකළ රජයේ නිලධාරිනියක එම ක්‍රමයෙන් ඉවත්වීමට පළකළ මනාපය ලැබුණු වහාම ඇයගේ දායක මුදල් අය කිරීම වහාම නැවැත්විය යුතුය.

1—ඒ. 084158—19,050 (85/05)

(ඇ) එතෙක් ගෙවූ දායක මුදල් ආපසු ලබා ගැනීමට පොදු 29 ආකෘතියේ (දෙපිටපතකින්) ඉල්ලුම් පතක් ඉදිරිපත් කළ යුතුය. එතෙක් වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අංකයක් ලබාගෙන නොමැති නම්, අංකයක් ලබා ගැනීම සඳහා පොදු ආකෘති '86අ' අයදුම්පතක්ද, දායකමුදල් ආපසු ලබාගැනීම සඳහා පොදු ආකෘති 29 ඉල්ලුම්පතක් සමඟ ඉදිරිපත් කළ යුතුය. විවාහ සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. මෙම ඉල්ලුම්පත් කොළඹ 1, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් කාර්යාලයේ ලේකම් හා ගණකාධිකාරී වෙත එවිය යුතුය.

(ඈ) එවිට මෙම වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය වෙත එතෙක් ගෙවන ලද සම්පූර්ණ දායක මුදල් පොලියක් රහිතව ලබා ගැනීමට හිමිකම් ඇත. එසේ දායක මුදල් ආපසු ලබාගත් නිලධාරිනියකට මෙම ක්‍රමය යටතේ වෙනත් කිසිදු ප්‍රතිලාභය කට හිමිකම් නොමැත.

4. 1983 අගෝස්තු මස 1 දිනට පසුව ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකට පත් කරනු ලබන සියළුම රජයේ නිලධාරිනියන් නිරායාසයෙන්ම මෙම විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි සාමාජිකයින් වනු ඇත.

5. **මනාපය වෙනස් කිරීමෙන් පසු දායක මුදල් ගෙවීම** :—දායකවීමට කලින් මනාපය පළ නොකළ, එහෙත් දැන් මෙම ක්‍රමයට බැඳීමට මනාපය පළ කරන රජයේ නිලධාරිනියන්ගෙන් මනාපය දෙපාර්තමේන්තුවට ලැබුණු වහාම දායක මුදල් අය කිරීම ආරම්භ කළ යුතුය. 83.08.01 දින සිට ඇති හිඟ දායක මුදල් වාර විසිහතර (24) කට නොවැඩි ගණනකින් අයකර ගත යුතුය.

6. **මියගිය නිලධාරිනියන්** :—දායකවීමට මනාපය පළ කිරීමට හිමිකම ඇති 1986 මැයි 10 දිනට ප්‍රථම මියයන රජයේ නිලධාරිනියක් ස්වාමිපුරුෂයෙකු හා/හෝ දරුවකු/දරුවන් ජීවත්ව සිටියදී මියගියහොත්, මෙම විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකවීමට කැමැත්ත ප්‍රකාශ කළ අයෙකු වශයෙන් සැළකිය යුතු අතර, වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුපක් ගෙවීම සඳහා පහත සඳහන් ලියකියවිලි, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් කාර්යාලයේ ලේකම් හා ගණකාධිකාරී වෙත එවිය යුතුය.

(i) ස්වාමිපුරුෂයා විසින් හෝ අනත්දරුවකු සම්බන්ධයෙන් නම් එම අනත්දරුවාගේ භාරකරු විසින් අත්සන් කළ පොදු 86 ආකෘතියෙන් ඉදිරිපත් කළයුතු මූලික ප්‍රකාශය

(ii) විවාහ සහතිකය.

(iii) මියගිය නිලධාරිනියගේ මරණ සහතිකය.

(iv) මු. රෙ. 1729 යටතේ වාර්තාව.

(v) සේවයේ යෙදී සිටියදී මියගිය අවස්ථාවකදී නම්, ඇය මියගිය දින විශ්‍රාම ගත්තා සේ සලකා පොදු 55 ආකෘතිය මගින් සම්පූර්ණ විශ්‍රාම වැටුප් ඉල්ලුම් පතක්.

7. **1983 අගෝස්තු 1 දිනට පෙර සේවය සඳහා දායක මුදල්** :

7 : 1 මෙම ක්‍රමයට බැඳීමට මනාපය පළකළ, 1983 අගෝස්තු 1 දිනට පෙර පත්වීම ලද, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ ගණන් ගත හැකි, විශ්‍රාම වැටුප් ලැබිය යුතු සේවයක් ඇති රජයේ නිලධාරිනියෙකුට, එම සේවය සම්බන්ධයෙන් සිය වැටුපෙන් සියයට හතරක (4%) දායක මුදලක් සහ සියයට හතරක (4%) පොලියක් සමඟ සිය කැමැත්ත අනුව ගෙවිය හැකිය.

7 : 2 ඉහත සඳහන් දායක මුදල හා පොළිය ගෙවීමට කැමැති වන අයෙකුට :—

(අ) ඒ නිලධාරිණිය රජයේ සේවයේ නිරතව සිටින කාලසීමාව තුළ ඕනෑම වේලාවක එකවර මුදලක් වශයෙන්; හෝ

(ආ) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම ලැබීමේදී ඇයට ගෙවියයුතු පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් ; හෝ

(ඇ) රජයේ සේවයෙන් ඇය විශ්‍රාම ලැබූ මාසයේ ඇගේ වැටුපෙන් කපා ගනු ලැබූ දායක මුදල් ප්‍රමාණය අනුව හෝ නිලධාරිනිය හා අධ්‍යක්ෂවරයා එකඟවන යම් වැඩි ප්‍රමාණයක් අනුව හෝ ඇගේ මාසික විශ්‍රාම වැටුපෙන් අඩු කරන මාසික කොටස් මුදල් වලින් හෝ ගෙවිය හැකිය.

7 : 3 1981 අගෝස්තු මස 1 වන දිනට පෙර කාලයට දායක මුදල් ගෙවීම අනිවාර්ය නොවේ.

8. කලින් ප්‍රකාශ කළ මනාපය වෙනස් කිරීමට මිට අමුණා ඇති ආකෘතිය අනුව අයදුම් කළ යුතුය.

Siriwardhana

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
ලේකම්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

---

'1' පරිශිෂ්ඨය

අංක 291 සහ 1985.05.21 වැනි දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාර මනාපය

(පිටපත් තුනකින් යැවිය යුතුයි)

(1) නිලධාරිනියගේ නම : ————.

(2) උපන් දිනය : ————.

(3) දරනු ලබන තනතුර :————.

(4) විශ්‍රාම වැටුප් සහිත තනතුරට පත්වූ දිනය :————.

අංක 231 සහ 1983.11.28 වැනි දින දරන රා. පරි චක්‍රලේඛය ප්‍රකාර .............................. .................................... වන මම, 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට බැඳීමට මෙයින් මනාපය පළකර සිටිමි*/පළ නො කරමි. මේ මනාපය අවලංගු කළ නො හැකි බවත්, මගේ මේ තෝරාගැනීම පසු අවස්ථාවකදී වෙනස් කර ගැනීමට මට ඉඩ නොදිය හැකි බවත් මම දනිමි. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 231 යටතේ මා මෙම ක්‍රමයට බැඳීමට මනාපය පළ කළෙමි*/නො කළෙමි.

————

නිලධාරිනියගේ අත්සන.

දිනය : ————.

## දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

ඉහත සඳහන් නිලධාරිනිය ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන බවත්, අංක 231 සහ 1983.11.28 දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාර මනාපය පළකර සිටීමට සුදුසුකම් ඇත්තියක බවත්, ඉහත සපයා ඇති විස්තර කාර්යාලයේ වාර්තා සටහන් වලට අනුව නිවැරදි බවත් සහතික කරමි.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/
විමධ්‍යගත ඒකකයේ ප්‍රධානියාගේ අත්සන.

දිනය:————————

---

මගේ අංකය ........................

ලේකම් හා ගණකාධිකාරී,
වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් කාර්යාලය.

පිටපත් දෙකකින් ඉදිරිපත් කරනු ලැබේ.

————————,
දෙපාර්තමේන්තුවේ/විමධ්‍යගත ඒකකයේ ප්‍රධානියා.

දිනය :————————

සැලකිය යුතුයි.—මේ මනාපයේ එක් පිටපතක් සේවිකාවගේ පෞද්ගලික ලිපි ගොනුවේ ගොනුකර තැබිය යුතුයි.

* අදාළ නොවන වචන කපා හරින්න.

Public Administration Circular No. 291

Ministry of Public Administration,
Independence Square,
Colombo 07. 21st May, 1985.

To : *All Secretaries and Heads of Departments.*

## The Widowers' and Orphans' Pension Amendment Act, No. 19 of 1985—Option by Female Officers

1. Reference is requested to Public Administration Circular No. 231 of 28.11.1983.

2. Section 3 of the Widowers' and Orphans' Pension Act, No. 24 of 1983 has been amended by Act No. 19 of 1985 to provide for an extension of time for a female public officer to make a fresh option to join the scheme whereby a Widower and Orphans of such an officer may get a pension.

3. *The position now is as follows* :

(i) *Eligibility to become a contributor.*

(*a*) a female public officer appointed to a permanent and pensionable post prior to 1st August, 1983, and in service on that day, who had not opted to be a contributor by 01.02.1984, may now opt to be a contributor before 10.05.1986.

(*b*) this fresh option can now be made by a female public officer who did not opt to be a contributor under the earlier Circular.

(*c*) this fresh option can now also be made by a female public officer who opted not to be a contributor under the earlier Circular.

(*d*) where a female public officer is dead or dies before 10.05.1986 she will, if she leaves behind a husband and/or a child/children, be deemed to have opted to be a contributor.

(ii) *Eligibility to withdraw from being a contributor.*

(*a*) a female public officer who opted to join the scheme under the earlier Circular may before 10.05.1986 opt to withdraw from being a contributor if she so desires.

(*b*) contributions from any female public officer who opted earlier to join the scheme but who now withdraws from the scheme should cease immediately on receipt of such option to withdraw.

(*c*) an application for refund of the contributions made upto that date, should be made on form General 29 (in duplicate). If Widowers' & Orphans' pension number has not been obtained so far, an application to obtain a number on for General 86A should be sent together with the refund application on form General 29. Supporting documents such as marriage certificates need not be enclosed. Such a refund application should be sent to the Secretary/Accountant, Widowers' and Orphans' Pensions Office, Colombo 01.

(*d*) she will then be entitled to a refund of the entirety of the contribution so far made without interest and upon such refund, she will cease to be entitled to any benefit under this scheme.

4. A female public officer appointed to a permanent and pensionable post, on or after 1st August 1983, will automatically become a member of the scheme.

5. *Contributions after change of option.*—Contributions from any female public officer who did not opt earlier, but wishes to join the scheme now, should commence immediately on the option being received by the Department. Arrears of contributions from 01.08.1983 can be made in instalments not exceeding twenty four.

6. *Deceased Officers.*—Any female public officer who dies before 10.05.1986 upto which date she could elect to be a contributor, and leaves behind a husband and/or child/children, should be deemed to have elected to be a contributor to the pension scheme and the following documents should be sent to the Secretary/Accoontant, W.&.O.P. Office, to enable him to pay a Widowers and Orphans' pension.

(i) An initial declaration on form General 86A signed by the husband, or the guardian in the case of an orphans pension.

(ii) Marriage certificate.

(iii) Death certificate of the officer.

(iv) F.R. 1729 report.

(v) In the case of death while in service a complete pension application on form General 55, treating her as if she had retired on the date of death.

7. *Contributions in respect of service prior to 1st August,* 1983.

7 :1 A female public officer appointed prior to 1st August, 1983, who has elected to join the scheme and who has reckonable pensionable service under the Minutes on Pensions, *may opt* to contribute at (4%) four percent of the aggregate of her salary in respect of such service together with (4%) four percent interest.

7 :2 The contributions and interest referred to in 7.1 above may be paid by the officer :—

(*a*) in one lump sum at any time during the period the officer is in public service ; or

(*b*) from the commuted pension payable to her on retirement under the Minutes on Pensions ; or

(c) in monthly instalments from her monthly pension either at the monthly rate at which contribution was recovered from her salary on the month in which she retired from public service or at such higher rate as may be agreed upon by the officer and the Director.

7:3 The contribution prior to 1st August, 1983 are not compulsory.

8. Change of the options made earlier should be made on the specimen annexed.

Siriwardhana

D. B. I. P. S. SIRIWARDHANA,
Secretary,
Ministry of Public Administration.

---

*ANNEX "A"*

Option in terms of Public Administration Circular No. 291 of 21.05.1985.

*(To be furnished in Triplicate)*

(1) Name of Officer :————,

(2) Date of Birth :————,

(3) Appointment held :————,

(4) Date of appointment to Pensionable Post :————,

I ................................ do/do not* opt, to join the Widowers' and Orphans' Pension (Act, No. 24 of 1983) Scheme. I am aware that this option cannot be changed on a subsequent date and that the option shall be irrevocable.

I further declare that I did*/did not make an option under Public Administration Circular No. 231.

Date : ————,  ————, *Signature of Officer.*

---

**Certificate of Head of Department**

I certify that the above officer holds a permanent and pensionable post and that she is entitled to opt, and join the Widowers' and Orphans' Pension scheme under Public Administration Circular No. 231 of 28.11.1983. The particulars given above by her are correct.

————,
Head of Department/
Head of Decentralised Unit.

Date : ————,

My No. ..........................

Secretary/Accountant,
Widows' and Orphans' Pension Office,
Colombo 1.

Forwarded in duplicate.

———————,
Head of Department/
Head of Decentralised Unit.

Date : ———————,

*N.B.*—A copy of this declaration should be filed in the officer's personal file.

* *Delete whatever is not applicable.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී